සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක / ජනපද නිලධාරී / සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියට සහ කාර්මික නිලධාරී (සිවිල්) II පන්තිය 'ආ' බණ්ඩයට / පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ

විවෘත තරග විභාගය - 2016

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් සබරගමුව පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණිය

02. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජනපද නිලධාරී III ශ්‍රේණිය

03. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය

04. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) II පන්තිය "ආ" බණ්ඩය

05. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණිය.

02. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය : 2016.03.31

03. 3.1 **පොදු සුදුසුකම් :**

(අ). අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ). විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

(ඇ). 2016.03.31 දිනට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් සබරගමුව පළාත් සභා බල ප්‍රදේශය තුළ තිබිය යුතුය.

(ඉ). වයස් සීමාව :

කෘෂිකර්ම උපදේශක / ජනපද නිලධාරී / සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

කාර්මික නිලධාරී (සිවිල්) / පුහුණු ශ්‍රේණිය

අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.)

3.2 **අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම්**

	තනතුර (තාක්ෂණ සේවයේ)	අධ්‍යාපන සුදුසුකම්		තාක්ෂණික සුදුසුකම්	පුරප්පාඩු සංඛ්‍යාව
		තනතුර සඳහා අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම	තනතුර සඳහා අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම		
01	**කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණිය**	සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.	අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂය ධාරාවන් යටතේ සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්වීම.)	I. කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයකින් නිකුත් කරන කෘෂිකර්මය පිළිබඳ ද්විඅවුරුදු ඩිප්ලෝමා සහතිකය හෝ II. හාඩි කාර්මික විද්‍යාලයෙන් නිකුත් කරනු ලබන කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය. හෝ III. ඇක්වයිනාස් විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය හෝ IV. රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන ද්‍වි අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය (තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) පහ (05) හෝ හය (06) මට්ටමේ කුසලතා සහතිකයක් කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය).	32
02	**ජනපද නිලධාරී III ශ්‍රේණිය**	සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.	අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂය ධාරාවන් යටතේ සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්වීම.)	I. කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයකින් නිකුත් කරන කෘෂිකර්මය පිළිබඳ ද්‍වි අවුරුදු ඩිප්ලෝමා සහතිකය හෝ II. හාඩි කාර්මික විද්‍යාලයෙන් නිකුත් කරනු ලබන කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය. හෝ III. ඇක්වයිනාස් විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය හෝ IV. රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන ද්විඅවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය (තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) පහ (05) හෝ හය (06) මට්ටමේ කුසලතා සහතිකයක් කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය).	01
03	**සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය**	සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.	අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විද්‍යා විෂය ධාරාව යටතේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම (පැරණි විෂය නිර්දේශය යටතේ නම් විෂයයන් 03 කින් එකවර සමත්වීම.)	සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන සත්ත්ව පාලන පුහුණුව පිළිබඳ විද්‍යාලයකින් ලබාගන්නා ලද සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය. (තාක්ෂණික ගණයේ තනතුරු සඳහා ඉහත අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) පහ (05) හෝ හය (06) මට්ටමේ සහතිකයක් සත්ව පාලන ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.)	13
04	**කාර්මික නිලධාරී (සිවිල්) II පන්තිය "ආ" බණ්ඩය**	භාෂාව හෝ සාහිත්‍ය ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.	පැරණි නිර්දේශය අනුව ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සහිතව විද්‍යා විෂයයන් 03 කින් අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වීම හෝ නව නිර්දේශ අනුව භෞතික විද්‍යාව හෝ සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් (03) අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම.	**පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.** I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව. II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා, ජාතික ඩිප්ලෝමාව III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම. VI. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකමක් ලබා තිබීම. **සටහන :** 1. ඉහත I සිට VI දක්වා වූ සුදුසුකම් සපුරා ඇති අය එම පාඨමාලා හැදෑරීමට බඳවාගන්නා අවස්ථාවේ එම පාඨමාලාවන්ට ඇතුලත්වීමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ. 2. ඉල්ලුම් කරන ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා සහතික ලබා තිබීම අනිවාර්යය වේ.	(කාර්මික නිලධාරී (සිවිල්) II පන්තිය 'ආ' බණ්ඩය සහ කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණිය සඳහා වන පුරප්පාඩු සංඛ්‍යාව - 64)
05	**කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණිය**	භාෂාව, හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.	පැරණි නිර්දේශය අනුව ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සහිතව විද්‍යා විෂයයන් 03 කින් සමත්වීම හෝ නව නිර්දේශය අනුව භෞතික විද්‍යාව හෝ සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම.	ජාතික තාක්ෂණික සහතිකය (සිවිල්) ලබා තිබීම හෝ ඊට සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම. **සටහන:** ඉහත සුදුසුකම් සපුරා ඇති අය එම පාඨමාලා හැදෑරීමට බඳවා ගන්නා අවස්ථාවේ එම පාඨමාලාවන්ට ඇතුලත්වීමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.	

04. I. ඉහත සඳහන් III ශ්‍රේණියේ තනතුරු සඳහා සහ කාර්මික නිලධාරී (සිවිල්) **II පන්තිය** "ආ" බණ්ඩයේ වැටුප් පරිමාණය.
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2008 අනුව හිමි මාසික වැටුප් පරිමාණය
රු. 15005-4x180-6x240-11x320-20x360 - 27,885/-

II. කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණිය සඳහා දීමනාව
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (II) අනුව හිමි මාසික දීමනාව
1 වසර - රු. 12,920/-
2 වසර - රු. 13,040/-

05. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

06. බඳවාගැනීමේ ක්‍රමය

තරග විභාගයේ ප්‍රතිඵල මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි සඳහන් විධිවිධාන අනුගමනය කරමින් දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත දිස්ත්‍රික් කුසලතාවය පදනම් කර ගනිමින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. විභාගයෙන් සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40 % කි.

I. ඉහත කෘෂිකර්ම උපදේශක / ජනපද නිලධාරී / සත්ව සංවර්ධන උපදේශක තනතුරු සඳහා වන විභාගයේ විෂය නිර්දේශය.

(01). බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි - ලකුණු 100 යි.

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න 50 කින් යුක්තය. මෙම ප්‍රශ්න බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. .

(02). විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය - කාලය පැය 02 යි. ලකුණු 100 යි.

තනතුරට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන බහුවරණ ප්‍රශ්න වලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

II කාර්මික නිලධාරී (සිවිල්) II **පන්තිය "ආ"** බණ්ඩයේ / පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා වන විභාගයේ විෂය නිර්දේශය :

(03). **බුද්ධි පරීක්ෂණය හා අභියෝගතාව - කාලය පැය 01 යි.**

මෙම ප්‍රශ්න පත්‍රය සංඛ්‍යාමය හැකියාව, ගැටලු නිරාකරණය, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කෙරෙන විෂයානුබද්ධ කෙටි ප්‍රශ්න 50 කින් යුක්ත වනු ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(04). **සාමාන්‍ය දැනීම - කාලය පැය 1 1/2 යි.**

මෙම ප්‍රශ්න පත්‍රය පරිසරය, විද්‍යාත්මක සොයාගැනීම්, විද්‍යා දැනුම හා ජාත්‍යන්තර තොරතුරු පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න වලින් යුක්තය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගය රත්නපුර හා කෑගල්ල නගර තුළ පමණක් පැවැත්වේ. විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ. පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුණහොත් විභාගයක් පැවැත්වීම ගැන සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

07. අයදුම් කිරීමේ ක්‍රමය

7.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඒ-4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද අංක 04 සිට 06 තෙක් දෙවන පිටුවටද ඉතිරිය තුන් වන පිටුවටද වශයෙන් ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.2 විභාග ගාස්තුව රු. 600/- කි. මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැරවන සේ සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. **ඉහත සඳහන් ආයතන වලට හැර වෙනත් කාර්යාලවලට (තැපැල් කාර්යාල, බැංකු) මුදල් ගෙවන ලද කුවිතාන්සි භාරගනු නොලැබේ.**

7.3 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2016-03-31 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නව නගරය, රත්නපුර** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016"** හෝ **"සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016"** යනුවෙන් සඳහන් කළ යුතුය. **නියමිත දිනට පසු ලැබෙන ඉල්ලුම්පත් හා එක් එක් තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

7.4 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වේනම් ඒ පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේ ය. එසේම මෙම බඳවාගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම මෙම කොමිෂන් සභාව සතු වේ.

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම් ,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත

2016-02-25